# ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි විපර්යකාරක වැඩසටහනෙහි බලපෑම (හබරාදූව විපර්යකාරක වැඩසටහන ආශ්‍රයෙන්)

ඒ. එම්. එස්. අතපත්තු
විභාග අංකය: FGS\E\2001\322\R.
ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය
කැලණිය.

FACULTY OF GRADUA...
23 SEP 2013
UNIVERSITY OF KELA...

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 842 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යාපති (ආර්ථික විද්‍යා) පරීක්ෂණයෙහි අවශ්‍යතාවක් පරිපූර්ණය කිරීම සඳහා ඉදිරිපත් කෙරෙන ස්වාධීන නිබන්ධිකාවකි.

# නිබන්ධ සාරාංශය


මූලික මිනිස් අවශ්‍යතා අවම මට්ටමින්වත් සපුරා ගැනීමට නොහැකිව සිටින ග්‍රාමීය දිළිඳු ප්‍රජාව, පවතින සංවර්ධන ප්‍රවාහයෙන් කොන්වී නිෂ්පාදනයේදී හා අලෙවියේදී නිරන්තර අවාසිදායක තත්ත්වයට පත් වෙති. එයට විකල්පයක් ලෙස, ප්‍රජාව ගැති මානසිකත්වයෙන් මුදවා විභව ශක්තිය පුබුදුවාලීම තුළින් ස්වශක්තිය හා සහභාගිත්වය වර්ධනය කිරීමට සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිත කරමින් කාර්යබද්ධ පර්යේෂණයක් ලෙස විපර්යකාරක වැඩසටහන ආරම්භ කරන ලදි. ඒ අනුව ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම කෙරෙහි විපර්යකාරක වැඩසටහනේ බලපෑම හඳුනාගැනීම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණවන අතර, දිළිඳුකම තුරන් කිරීමේදී පුද්ගල විභව ශක්තිය පුබුදුවාලීම සඳහා සමාජ සජීවීකරණ ක්‍රියාවලියේ භාවිතය සහ ප්‍රජාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීමට විපර්යකාරක වැඩසටහන තුළ ගොඩනැගී ඇති සංවර්ධන වැඩසටහන්වල දායකත්වය හඳුනාගැනීම අතුරු අරමුණු වේ. හබරාදුව විපර්යකාරක වැඩසටහන ක්‍රියාත්මක ග්‍රාමීය සංවිධාන 23 ක් අතරින් ආරම්භක හා අඛණ්ඩව පවත්වාගෙන එන කොග්ගල අතිරේක 01 හා වැල්අද්දරගොඩ සංවිධාන දෙකෙහි සාමාජික පවුල් 137 ක් තුළින් ආදායම් උත්පාදනය කටයුතු සඳහා ණය ලබාගෙන ඇති සාමාජික පවුල් 105 ක් නියැදිය ලෙස තෝරා ගන්නා ලදි. මෙහිදී ප්‍රාථමික දත්ත රැස්කිරීම සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්නාවලියක් යොදාගත් අතර, සම්මුඛ සාකච්ඡා සහ සහභාගිත්ව නොවන නිරීක්ෂණ ක්‍රමද භාවිත කරන ලදි. ඊට අමතරව පොත්, සඟරා සහ වාර්තා ආදි ද්විතියික මූලාශ්‍ර භාවිත කරන ලදි. දත්ත විශ්ලේෂණය සඳහා විස්තරාත්මක විශ්ලේෂණ ක්‍රම සහ ගුණාත්මක විශ්ලේෂණ ක්‍රම භාවිත කරන ලදි.

ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීමට ප්‍රජාවගේ විභව ශක්තිය පුබුදුවාලීම සඳහා සමාජ සජීවීකරණ ක්‍රියාවලිය කාලීන අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි භාවිත කර ඇත. කුඩා කණ්ඩායම්, ග්‍රාමීය සංවිධාන හා ප්‍රාදේශීය සංවිධාන ආදි කාර්යක්ෂම ප්‍රජා සාංවිධාන ජාලයක් තුළ ආදායම් උත්පාදන මාර්ග ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම, පාරිභෝජන වියදම් පාලනය, ඉතුරුම් හා චක්‍රිය ණය ක්‍රියාවලියක් ආරම්භ කිරීමට හැකිවන පරිදි විවිධ සංවර්ධන වැඩසටහන් ආරම්භ කර ඇති අතර, ඒ තුළින් ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය වර්ධනයවී මූලික අවශ්‍යතා ඉහළ මට්ටමින් සපුරා ගැනීමට සමත්වී ඇත. ඒ අනුව ග්‍රාමීය දිළිඳු ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය හා සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය භාවිත කළ විපර්යකාරක වැඩසටහන අතර ධනාත්මක සම්බන්ධතාවක් පවතින බව අධ්‍යයනය තුළින් සනාථ විය.



**මුඛ්‍ය පද**: විපර්යකාරක වැඩසටහන, ග්‍රාමීය දිළිඳුකම, සමාජ සජීවීකරණය, සහභාගිත්ව සංවර්ධන ක්‍රමවේදය, ස්වශක්තිය හා සහභාගිත්වය.